# බුදු ගුණයට පැහැදී බෝධියට උවටැන් කරන්න කල්ප ගණනක් දුගතියෙන් මිදෙන්න

## බෝධිඋපට්ඨාක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 334 - 335)

අමරාවතී නගරයේ ජීවත් වූ ඔහු උදේ සවස උතුම් වූ බෝධිය වෙත ගොස් ශ්‍රද්ධාවෙන් උපස්ථාන කළා.

එම කුසලයේ ආනිසංස ලෙස ඔහු එක්දහස් අටසිය කල්පයක් දුගතියෙන් මිදුණා. සක්විති රජකම ද ලැබුවා. ගෞතම බුදු සසුනේ පැවිදි බව ලබා රහත් වුණා.